සමාජ සමීක්ෂා, වෙළුම 1, කලාපය 2, පිටු අංක 25-42, 2016

සමාජ සමීක්ෂා: සමාජීය විද්‍යා ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය
ISSN 2478-0472
http://www.socialaffair.org

# ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ සංස්කෘතික සංචාරක විභවතාව

විජිතපුර විමලරතන*
ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ

**සංක්ෂේපය**

ජාත්‍යන්තර සංචාරක ව්‍යාපාරය අතීතයේ සිට ම ඉතා විශාල වර්ධනයක් පෙන්නුම් කරන අතර මෙම උපනතිය තව දුරටත් නොකඩවා ඉදිරියට ද පවතිනු ඇත. ශ්‍රී ලංකාව පුරාතන යුගයේ සිට ප්‍රධාන සංචාරක ආකර්ශනයන් අතරින් ප්‍රමුඛ ස්ථානයන් ගන්නා ලදී. ප්‍රමාණයෙන් කුඩා දිවයිනක් වුව ද ආගමික හා සංස්කෘතික විවිධත්වය අතරින් ශ්‍රී ලංකාව පොහොසත් ය. බහුතරයක් ජනතාවගේ ප්‍රධාන ආගම බුදු දහම වුව ද රටෙහි ජනගහනයෙන් කොටසක් හින්දු, ක්‍රිස්තියානි හා ඉස්ලාම් යනාදී ආගම් ද අදහයි. ශ්‍රී ලංකාවේ මෙම සාරවත් සංස්කෘතික උරුමයන්, ආගමික ඇදහිලි, ඓතිහාසික ස්මාරක සහ ඉපැරණි නගර, භාවනා, යෝග, ගැමි සංගීතය, නර්තනය, උත්සව චාරිත්‍ර හා ශාන්තිකර්ම යන සියලු ම අංශයන් හි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුණකි. බහු ආගමික ආකර්ශනයක් ඇති විශේෂ ස්ථාන මගින් සාරවත් සංස්කෘතික විවිධත්වය හා ආවේණික බව පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවෙහි උතුරු මැද පළාත වසර 1000 කට වඩා පැරණි ප්‍රධාන අගනගර දෙකකින් සමන්විත වන අතර එබැවින් එම ප්‍රදේශය විශේෂයෙන් ම  සංස්කෘතික සම්පත්වලින් පරිපූර්ණ ප්‍රදේශයක් බවට පත් වී ඇත.

**සංස්කාරක සටහන:** මෙම ලිපිය, Social Affairs: A Journal for the Social Sciences, 2016, 1(4) හි පළ වූ Cultural Tourism Potential in the North Central Province of Sri Lanka (පිටු.45-63) ලිපියෙහි සිංහල පරිවර්තනය ලෙස කේ.ඒ.ඩී.එස්.එම්. කොඩිතුවක්කු, ඩී.ඩබ්.ආර්.කේ. වෛද්‍යතිලක සහ එන්.පී.පී. සඳමාලි විසින් සම්පාදනය කරන ලදී.

**මූලික පද:** : බුදුදහම, සංස්කෘතිය, ස්මාරක, ආගම, සංචාරකයෝ

## හැඳින්වීම

අඹ ඵලයක හෝ කඳුළු බිඳුවක හැඩති ශ්‍රී ලංකාව, ඉන්දියන් සාගරයේ පිහිටි දූපතක් වන අතර එය ඉන්දියාවේ දකුණු ප්‍රදේශයට ආසන්න ව එහෙත් ඉන් වෙන් ව පිහිටා ඇත. එසේම පෝක් සමුද්‍ර සන්ධිය හා මන්නාරම් බොක්ක මගින් ඉන්දියානු උප මහද්වීපයෙන් වෙන් වී ඇත. මෙම දිවයින හෙළදිව, තැප්‍රොබේන්, සිලෝන්, දෛවයේ දිවයින හා ආසියාවේ මුතු ඇටය යනා දී නම්වලින් ද හඳුන්වන අතර උතුරු අක්ෂාංශ 5° 55` හා 9° 55` අතර ද නැගෙනහිර දේශාංශ 79° 42` හා 81° 52` අතර ද පිහිටා

*කර්තෘ විද්‍යුත් ලිපිනය:
wimala10@gmail.com
© 2016 සමාජ සමීක්ෂා. This work is licensed under a Creative Commons Attribution-Non Commercial 4.0 International License.

ඇත. සාගර තීරයේ කිලෝමීටර් 1,340 (සැතපුම් 833) ඇතුළුව ශ්‍රී ලංකාව වර්ග කිලෝමීටර 65,610 (වර්ග සැතපුම් 25,332) ක මුළුබිම් ප්‍රමාණයක් ආවරණය කරයි. රටෙහි උපරිම දිග, පළල පිළිවෙලින් කිලෝමීටර් 435 හා කිලෝමීටර් 225 ක් වේ. එය මුහුදු සුළඟට හා වර්ෂාවට නිරාවරණය වූ සදාහරිත දිවයිනක් වන අතර භූමි ආරෝහයට ඉඩපහසුකම් සැලසීම තුළින් වෙනස් වූ දේශගුණික තත්වයන්ට උරුමකම් කියයි. මෙම දිවයිනෙහි දහවල් කාලයෙහි සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 28 (අවම) හා සෙල්සියස් අංශක 32 (උපරිම) අතර වෙනස්වෙමින් පවතී. දිවයිනේ සාමාන්‍ය උෂ්ණත්වය මධ්‍යම කඳුකරයේ පිහිටි නුවරඑළියේ දී සෙල්සියස් අංශක 16 ක අවමයකුත් ඊසානදිග වෙරළ තීරයේ පිහිටි ත්‍රිකුණාමලයේ දී සෙල්සියස් අංශක 32 ක උපරිමයකුත් අතර විචලනය වෙයි (විමලරතන, 2000).

වාර්ෂික වර්ෂාපතන ව්‍යාප්තිය අනුව ශ්‍රී ලංකාව ප්‍රධාන කෘෂිකාර්මික දේශගුණික කලාප තුනකට බෙදා දැක්වේ. එනම් රටෙහි මධ්‍යම කඳුකරය ඇතුළු නිරිත දිග ප්‍රදේශය තෙත් කලාපය ලෙසත්, ප්‍රධාන වශයෙන් ම උතුර හා උතුරු මැද පළාත දකුණ හා නැගෙනහිර පළාත වියළි කලාප ලෙසත්, මෙම කලාප දෙකට අතර මැද පවත්නා ප්‍රදේශ අන්තර්මධ්‍ය/අතරමැදි කලාප ලෙසත් හඳුන්වයි. භූමියෙන් විශාල ප්‍රමාණයක් ආවරණය කරන්නේ වියළි කලාපය වන අතර එය 63.5% කි. තෙත් කලාපය හා අතරමැදි කලාපය පිළිවෙලින් 23.2% හා 13.3% ක ප්‍රමාණයක් ආවරණය කරයි. තේ රබර් හා පොල් යන සියලු ම ප්‍රධාන විජිතවාදී වතු බෝග තෙත් කලාපය ආශ්‍රිතව විමධ්‍යගත වී ඇති අතර කුඹුරු විශාල ප්‍රමාණයක් ස්ථානගත වී ඇත්තේ රටෙහි වියළි කලාපය ආශ්‍රිතව ය. පළාත් අනුව නිෂ්පාදනයන්හි විවිධත්වයක් පැවතිය ද පළතුරු, එළවලු, කුළුබඩු හා නිත්‍ය භෝග යනාදී අනෙකුත් මිශ්‍ර බෝග වගාවන් රටෙහි ඉතා සුලභ වගාවන් ය. සංවිධානාත්මක වශයෙන් මෙම රට පළාත් 9 කට බෙදා ඇති අතර එය පළමු ස්ථරය ලෙස හැඳින්වේ. එමෙන් ම ප්‍රධාන දිස්ත්‍රික්ක 25 කට බෙදා ඇති අතර එය දෙවන ස්ථරය ලෙස හැඳින්වේ. දිස්ත්‍රික්ක නැවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණනකට බෙදා දක්වන අතර ඒවා නැවත ග්‍රාම නිලධාරී කොට්ඨාස ලෙස අනුකොටස්වලට බෙදා දැක්වේ. මෙය කුඩා ම පාලන කොට්ඨාසයයි. ශ්‍රී ලංකාව දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස 330 කින් හා ග්‍රාම නිලධාරී කොට්ඨාස 14022 කින් සමන්විත වේ. ඊට අමතරව නගර සභා 23 ක් හා නගර මණ්ඩල 41 ක් පවතී (ජනලේඛන හා සංඛ්‍යාත දෙපාර්තමේන්තුව, 2012).

1950 වර්ෂයේ දී මිලියන 7.5 ක් දක්වා වූ මුළු ජනගහනය 2013 වන විට මිලියන 21 දක්වා ඉහළ ගොස් ඇත. මෙම කාලය තුළ වාර්ෂික සාමාන්‍ය ජනගහන වර්ධන වේගය 3.3% සිට 0.8% දක්වා පහළ වැටී ඇත. මෙම කාලපරිච්ඡේදය ආරම්භයේ දී ග්‍රාමීය ජනගහනය 84.7% ක ප්‍රතිශතයක් ලෙස පැවති අතර නාගරික ජනගහනය 15.3% ලෙස පැවතුනි. රටේ බහුතරයක් ලෙස ග්‍රාමීය අංශය ආශ්‍රිත ජනාවාස රටාවක් ඇති බැවින් දශක 6 ක දිගු කාලපරිජේදයක් තුළ මෙම සංයුතිය වෙනස් වී ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකිනි. කෙසේ වුව ද මෙම කාල පරිජේදය තුළ ජන ඝනත්වය එනම්, වර්ගකිලෝමීටරයක් සඳහා සිටින පුද්ගලයන් ප්‍රමාණය, 126 සිට 327 දක්වා ඉහළ ගොස් ඇත(ශ්‍රී ලංකා මහ බැංකුව, 2013).

ශ්‍රී ලංකාව පසුගිය අවුරුදු 6 ක කාලය තුළ පහළ ආදායම් ලබන කාණ්ඩයේ සිට පහළ මැදි ආදායම් ලබන රටක් දක්වා ක්‍රමයෙන් දියුණු වී ඇත. 1950 වර්ෂයේ දී ඇමරිකන් ඩොලර් 114 ක්ව පැවති ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය, දිගු කාලයක් තුළ වර්ෂයකට ඇමරිකන් ඩොලර් 49 බැගින් එකතු වෙමින් 2013 වන විට ඒක පුද්ගල ආදායම ඇමරිකන් ඩොලර් 3280 දක්වා ඉහළ ගොස් ඇත (මහ බැංකුව-ශ්‍රී ලංකාව, 2013). දරිද්‍රතාව, පසුගිය වසර 60 ක කාලය තුළ ශ්‍රී ලංකාවේ සමාජයට දැඩිසේ බාධා පැනවූ අතර එහි පීඩනය ඉදිරියට ද සමාජයේ ශිෂ්ට සමතුලිතතාවයට බාධා කරනු ඇත. පශ්චාත් නිදහස් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් (විශේෂයෙන් ම අභ්‍යන්තර කෘෂිකාර්මික අංශය ආශ්‍රිතව) සහ සුබසාධන ප්‍රතිපත්තීන් මඟින් දරිද්‍රතාවය විශාල ප්‍රමාණයක් දක්වා අවම කොට ඇත. කුටුම්බ ආදායම් වියදම් සමීක්ෂණයට අනුව ජාතික දරිද්‍රතාව අනුපාතය

1990/91 වර්ෂවල 26.1 ප්‍රමාණයක පැවති අතර එය 2012/2013 වන විට ක්‍රමයෙන් 6.7 දක්වා පහළ වැටී ඇත (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2014). ඒක පුද්ගල ආදායමේ වර්ධනය හා අනෙකුත් දියුණු වෙමින් පවතින රටවල් සමඟ සංසන්දනය කරන විට රටෙහි සමස්ත සමාජ ආර්ථික සංවර්ධනය යහපත් මට්ටමක පවතී. වර්තමානයෙහි ලෝකයේ රටවල් 187 ක් අතරින්, ශ්‍රී ලංකාව මානව සංවර්ධන දර්ශකයෙහි (HDI) 72 වන ස්ථානයට තේරීපත් වී ඇත (UNDP, 2014).

ශ්‍රී ලංකාව බහු සංස්කෘතික, බහු ආගමික, බහු වාර්ගික හා බහු භාෂාමය රටකි. මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික ව්‍යාපාරයෙහි විභවතාවන් අධ්‍යයනය කිරීම තුළින් රටෙහි ආර්ථිකමය ධාරිතාව ශක්තිමත් කිරීමයි. මෙහි දී රටෙහි උරුමයන් හා ඒවායේ ප්‍රාදේශීය විෂමතාවන් පිළිබඳ විශේෂයෙන් ම අවධානය යොමු කරනු ඇත. ක්‍රි.පූ. 6 වන සියවසෙහි සිට ලිඛිත අතීතයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ සංස්කෘතික හා ආගමික තොටිල්ල ලෙස හැඳින්වෙන උතුරු මැද පළාත මෙම අරමුණ සඳහා තෝරා ගනී. ද්විතියික දත්ත, ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ මූලික දත්තදායකයින් සමඟ පවත්වනු ලැබූ සම්මුඛ සාකච්ඡා මෙම ලිපියට අදාළ තොරතුරු රැස්කිරීමේ ප්‍රධාන මූලාශ්‍රයන් වේ.

## ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය

ශ්‍රී ලංකාව සඳහා අවශ්‍ය පරිපූර්ණ සංචාරක ප්‍රවර්ධන වැඩපිළිවෙලක් බොහෝ කලක සිට ක්‍රියාත්මක වී නැත. බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවති කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය වැවිලි කර්මාන්ත අංශය මගින් ලැබූ ලාභය මත රඳා පැවති අතර සංචාරක කර්මාන්ත ප්‍රවර්ධන සඳහා කුඩා හෝ අවධානයක් යොමු කළේ නැත. එසේ සිදුවුණි නම් එය ආදායම් ඉපයීමේ අනර්ඝ මූලාශ්‍රයක් වනු ඇත. යටත් විජිතවාදී පාලන තන්ත්‍රය යටතේ 1937 දී රාජ්‍ය සංචාරක කාර්යාංශයක් ස්ථාපිත කළ අතර එමගින් කොළඹ වරාය හරහා නැගෙනහිර හා බස්නාහිර පළාත් තුළ සංචාරය කරන විශාල ප්‍රමාණයක් වූ මගීන් සඳහා අවශ්‍ය පහසුකම් හා සේවාවන් සලසන ලදී. මෙම කාලච්ඡේදය තුළ කොළඹ වරාය ආශ්‍රිත පහසුකම් හා සේවාවන් ලබාගත් මගීන් සංඛ්‍යාව වාර්ෂිකව ලක්ෂයට අධික ප්‍රමාණයක් බව ඇස්තමේන්තු කර ඇත. කෙසේ වුව ද දෙවන ලෝක යුද ආක්‍රමණ හේතුවෙන් කොළඹ වරායට පැමිණි මගීන් සංඛ්‍යාව විශාල ලෙස පහත වැටුන අතර එබැවින් සංචාරක කාර්යංශයක් සඳහා පවතින අවශ්‍යතාවය නිශේධනය විය.

1948 දේශපාලන ස්වාධීනතාවයත් සමඟ සංචාරක කාර්යාංශයක් ස්ථාපිත කරන ලදී. මෙම කාලයේ දී සංචාරක ප්‍රවාහන ක්‍රමය මුහුදු ගමන්වල සිට ගුවන්යානා හරහා සිදුකරනු ලබන ප්‍රවාහනයන් දෙසට වෙනස් වූ අතර මෙම වෙනසට ඒ වන විට ශ්‍රී ලංකාව සූදානම් ව සිටියේ නැත. රටෙහි පැවැති එක ම ජාත්‍යන්තර ගුවන් තොටුපල වූ කොළඹ ගුවන් තොටුපල 1960 මැද භාගයේ දී පුළුල් කළ අතර 1968 දී නව පර්යන්ත ගොඩනැගිල්ලක් විවෘත කළේ ය. පොදු සම්පතක් වශයෙන් ශ්‍රී ලංකා හෝටල් පාසල සංචාරක ව්‍යාපාරය සඳහා අවශ්‍ය වූ පුහුණු මිනිස් ශ්‍රමය ලබාදීමට 1964 වර්ෂයේ දී නීතිගත කළ අතර 1966 දී ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය ආරම්භ කරන ලද අභිනවයෙන් පත් වූ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය මෙම කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය නව්‍යකරණ ක්‍රමෝපායක් හඳුන්වාදීම මගින් මෙම ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය සඳහා මහත් පරිශ්‍රමයක් දැරී ය. කෙසේ වුව ද 1977 විවෘත අර්ථක්‍රමය හඳුන්වා දෙන තුරු රජය විසින් ක්‍රියාත්මක කළ අභ්‍යන්තර නැඹුරු ප්‍රතිපත්තීන් හා පෞද්ගලික අංශ විරෝධී ප්‍රතිපත්ති හේතුවෙන් මෙම පරිශ්‍රම ඵලරහිත එකක් විය. මෙම සංවර්ධනයන් 2009 සිවිල් යුද්ධය අවසන් වන තුරු සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධිය පිළිබඳ ව සොයා බැලී ය. සිවිල්යුද සමයේ මෙම කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා 2005 වර්ෂයේ දී සංචාරක සංවර්ධන අධිකාරිය ස්ථාපිත කළේ ය (ශ්‍රී ලංකා මහ බැංකුව 2011, 2013).

සිවිල් යුද්ධය අවසන් වීමේ ප්‍රතිඵලයක් ලෙසින් අද වන විට සංචාරක කර්මාන්තය පෙර නොදුටු විරූ ආකාරයේ වර්ධනයක් පෙන්නුම් කරයි.

"ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය 2015 වර්ෂය තුළ ද අතිමහත් වූ සාර්ථකත්වයක් අත්පත් කරගනිමින් පශ්චාත් ගැටුම් සමයේ අතිවිශාල වර්ධනයක් ළඟා කරගත් කර්මාන්ත අතුරින් එකක් බවට පත් වී ඇත" (ශ්‍රී ලංකා මහබැංකුව 2015).

දේශීය හා විදේශීය ආයෝජන මෙම අංශයට නොකඩවා ගලා එන නමුත් ආගමික හා සංස්කෘතික සංචාරක ව්‍යාපාරය මෙහි විශේෂ නිෂ්පාදනයක් ලෙස ප්‍රවර්ධනය කරන්නේ නැත. ශ්‍රී ලංකාව දේශපාලනික නිදහස හා ආරක්ෂාව යන අංශවලින් නව යුගයකට එළඹ ඇති බැවින් නුදුරු අනාගතයේ දී සංචාරකයන්ගේ පැමිණීම විශාල වශයෙන් වැඩි වෙතැයි අපේක්ෂා කළ හැකි ය. මීට අමතර ව යුද්ධයෙන් විනාශ වූ ප්‍රදේශවල පැවැති පැරණි සංචාරක ආකර්ෂණයන් නැවත වරක් සංචාරක ව්‍යාපාරයෙහි නිෂ්පාදනයන්වලට එක් කළ හැකි ය.

සිවිල් යුද්ධය අවසන් වීමේ ප්‍රතිඵලයක් ලෙසින් සංචාරකයන්ගේ පැමිණීම මෙන් ම හෝටල් කාමර ඉල්ලුම් කිරීමේ අනුපාතය ද ඉහළ ගොස් ඇත. යුරෝපයේ හා ඇතැම් රටවල ආර්ථික දුෂ්කරතාවන් මෙම වර්ධනයට යම් බාධාවක් සිදු කළ ද, මෙම කර්මාන්තය උදෙසා සිදු කෙරෙන

වගුව 1: අරමුණ අනුව සංචාරකයන්ගේ පැමිණීම

| වර්ෂය | විනෝදය | | ව්‍යාපාර | | අනෙකුත් | | මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය % | සංඛ්‍යාව | ප්‍රතිශතය % | සංඛ්‍යාව | ප්‍රතිශතය % | |
| 2001 | 300545 | 89.23 | 22677 | 66.73 | 13572 | 04.02 | 336794 |
| 2002 | 335898 | 85.43 | 36793 | 09.35 | 20480 | 05.20 | 393171 |
| 2003 | 404327 | 80.79 | 45558 | 09.10 | 50553 | 10.10 | 500438 |
| 2004 | 442534 | 78.15 | 59961 | 10.59 | 63707 | 11.25 | 566202 |
| 2005 | 382321 | 69.60 | 92879 | 16.90 | 74168 | 13.49 | 549308 |
| 2006 | 392766 | 70.18 | 96981 | 17.33 | 69856 | 12.48 | 559603 |
| 2007 | 331238 | 67.05 | 52116 | 10.54 | 110654 | 22.39 | 494008 |
| 2008 | 321079 | 73.22 | 37261 | 08.49 | 80135 | 18.27 | 438475 |
| 2009 | 358188 | 79.97 | 38473 | 08.58 | 51229 | 11.43 | 447890 |
| 2010 | 516538 | 78.82 | 83270 | 12.72 | 54668 | 08.35 | 654476 |
| 2011 | 663343 | 77.50 | 68097 | 07.96 | 124535 | 14.55 | 855975 |
| 2012 | 748436 | 74.43 | 90040 | 08.95 | 167129 | 16.62 | 1005603 |
| 2013 | 980162 | 76.90 | 94320 | 07.40 | 200111 | 15.70 | 1274593 |

මූලාශ්‍රය: මහ බැංකු වාර්තාව 2011, 2013, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2014.

නව ආයෝජන හා ප්‍රවර්ධන වැඩසටහන් හේතුවෙන් මෙම උපනතිය තවදුරටත් ඉදිරියට පැවතීමක් අපේක්ෂා කළ හැකි ය.

කෙසේ වුව ද ආසියාවේ ශීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථිකයන් සතු රටවල්, විශේෂයෙන් ම චීනය හා ඉන්දියාව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට අමතර වාසියක් ලබා දීමට සමත් වී ඇත. විනෝදය සඳහා පැමිණෙන සංචාරකයන්ගේ ප්‍රතිශතය ක්‍රමයෙන් පහළ ගිය ද බහුතරයක් සංචාරකයන් පැමිණෙන්නේ මෙම අරමුණ සඳහා ය. ව්‍යාපාර හා අනෙකුත් අරමුණු සඳහා පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාව මෑත අතීතය තුළ දී ඉහළ ගොස් ඇත. විනෝදය සඳහා පැමිණෙන සංචාරකයන්ගේ යම් ප්‍රතිශතයක් හා අනෙකුත් අරමුණු සඳහා පැමිණෙන සංචාරකයන්ගේ යම් ප්‍රතිශතයක් සංස්කෘතික හා ආගමික වශයෙන් වැදගත් ස්ථානයන්

හි සංචාරය කිරීමට හැරුණු කොට ආගමික අංශය සඳහා සංචාරක ව්‍යාපාරය තුළ වෙන ම ප්‍රභේදයක් නොපවතින බව පැහැදිලිව පෙනෙන කරුණකි. මීට අමතරව ශ්‍රී ලංකාවට පැමිණෙන සියලු ම සංචාරකයන් මෙහි සිටින කාලය තුළ දී ඔවුන් යම් ප්‍රමාණයකට දේශීය සංස්කෘතික හා ආගමික ඇදහිලි පිළිබඳ අත්දැකීම් ලබා ගනී. එබැවින් සංස්කෘතික සංචාරක ව්‍යාපාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ආදායම් ඉපයීමෙහි කදිම මාර්ගයක් වනු ඇත. සංස්කෘතික හා ආගමික වශයෙන් වැදගත් සම්පත්වලින් සමන්විත වූ උතුරු මැද පළාතෙහි සංචාරය සඳහා සැලකිය යුතු ප්‍රතිශතයක් දේශීය සංචාරකයන් ද සහභාගී වේ. ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත වසර 1000 කට වඩා පැරණි ප්‍රධාන නගර දෙකකින් සමන්විත වන අතර එබැවින් එම ප්‍රදේශය විශේෂයෙන් ම ආගමික හා සංස්කෘතික සම්පත්වලින් පරිපූර්ණ ප්‍රදේශයක් බවට පත් වී ඇත. උතුරු හා නැගෙනහිර පළාත්වලට මායිම් ව පිහිටා ඇති බැවින් නුදුරු අනාගතයේ දී එම ප්‍රදේශය කෙරෙහි ඇදී එන සංචාරකයන් ප්‍රමාණයේ ඉහළ යාමක් අපේක්ෂා කළ හැකි ය. මෙම පළාත, බුදු දහම හා හින්දු සංස්කෘතියෙහි වැදගත් ස්ථානවල සංයෝගාත්මක නිර්මාණයක් වන අතර, එබැවින් අතීතයෙහි සාර්ථක ලෙස සිදු වූ සිංහල හා හින්දු පාලනයන් හා ඒවායෙහි බිඳවැටීම් පෙන්නුම් කරන සලකුණක් ලෙස ද හැඳින්විය හැකි ය. එබැවින් උතුරු මැද පළාත තුළ සංස්කෘතික හා ආගමික උරුමයන් ප්‍රවර්ධනය සඳහා අනුග්‍රහය ලබාදීම අසීරු නොවේ.

වගුව 2: සංස්කෘතික ත්‍රිකෝණය නැරඹීමට පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය හා ඔවුන්ට අලෙවි කිරීම තුළින් ලැබෙන ආදායම

| වර්ෂය | සංචාරකයන් ප්‍රමාණය | ආදායම (රුපියල් මිලියන) |
|---|---|---|
| 1988 | 74,062 | 14.1 |
| 1989 | 79,683 | 19.2 |
| 1990 | 124,382 | 44.7 |
| 1991 | 132,641 | 69.6 |
| 1992 | 153,817 | 102.3 |
| 1993 | 148,913 | 149.6 |
| 1994 | 168,402 | 176.1 |
| 1995 | 166,661 | 168.7 |
| 1996 | 102,788 | 121.3 |
| 1997 | 144,517 | 186.0 |
| 1998 | 165,463 | 225.0 |
| 1999 | 207,398 | 300.0 |
| 2000 | 155,167 | 276.0 |
| 2001 | 129,201 | 222.0 |
| 2002 | 131,804 | 242.8 |
| 2003 | 212,521 | 403.3 |
| 2004 | 246,380 | 543.1 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය.

## උතුරු මැද පළාත

සිංහල, දෙමළ හා මුස්ලිම් යන ප්‍රධාන ජනකොට්ඨාස තුනකින් ශ්‍රී ලංකාව සමන්විත වී ඇත. අතීත වාර්තාවන්හි දැක්වෙන පරිදි ශ්‍රී ලංකාවේ නවීන ජනාවාසකරණය ක්‍රි.පූ. 544 වන සියවසයෙහි ඉන්දියාවේ උතුරු නැගෙනහිර පළාතේ බෙංගාල් නම් ප්‍රදේශයෙහි ජන කොටසක් මෙරටට සංක්‍රමණය වීමත් සමඟ ආරම්භ වී ඇති අතර පසුකාලීනව මොවුන් 'සිංහල' ජාතිය ලෙසට ක්‍රමයෙන් විකාශනය වී ඇත. මෙම බහුජන සංක්‍රමණය, විවිධ වූ කුසලතාවන් හා දැනුමෙන් පරිපූර්ණ වූ මෙන්ම විවිධ සංස්කෘතීන්ට අයත් වූ පුද්ගලයන් සැලකිය යුතු ප්‍රමාණයක් රට තුළට ගෙන ඒමට සමත් විය. ඓතිහාසික තොරතුරුවලට අනුව මොවුන්ගේ පැමිණීමෙන් වසර කිහිපයකට පසුව, ඔවුන් දකුණු ඉන්දීය ද්‍රවිඩ ප්‍රදේශයන්හි වෙසෙන ජනයා සමඟ පැවැත්වූ වෛවාහක ගිවිසුම් ස්ථිරව ඉදිරියට ගෙන යාමට කටයුතු කළ අතර දකුණු ඉන්දීය කර්මාන්තකරුවන් ද මෙරට ගෙන්වා ගන්නා ලදී.

ඔවුන් පදිංචි වූ ප්‍රදේශය සිංහල රාජධානියේ අගනගරය බවට පත් වූ අතර මෙම යුගය ක්‍රි.පූ 13 වන සියවසෙහි මැද දක්වා විස්තාරණය වූ අතර, මෙම රාජධානිය තෙත් කලාපයට විතැන් වීම දක්වා ම රාජධානිය ස්ථාපිත වී තිබී ඇත්තේ මෙම ප්‍රදේශයෙහි ය.

මෙම යුගය ඓතිහාසික යුගය ලෙස මෙන්ම අනුරාධපුර-පොළොන්නරුව හෝ රජරට යුගය හෝ වශයෙන් ද හඳුන්වයි. ශ්‍රී ලංකාවේ වර්තමාන සංස්කෘතික හා ආගමික අංගයන්ගේ නිධානයන් මෙම ඓතිහාසික වකවානුව තුළ මුල්ගත වී ඇත.

මෙම ප්‍රදේශය, තම්බපණ්ණිය, උපතිස්ස, අනුරාධපුරය, සීගිරිය හා පොළොන්නරුව යන රාජධානීන් සියල්ලෙහි ම මූලික භූමිය ලෙස පැවතී ඇත. වසර 1873 බ්‍රිතාන්‍ය නීතිය යටතේ උතුරු මැද පළාත වෙනම පාලන තන්ත්‍රයක් බවට පත් කොට ඇත (විමලරතන, 2000). බ්‍රිතාන්‍ය පාලන ක්‍රමයට අනුව දේශ සීමාවන් සලකුණු කරීමේදී ඔවුන් එම පළාතට අයත් ප්‍රතිමූර්තීන් පිළිබඳ තැකීමක් සිදු කර නැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ස්වදේශීය කොට්ඨාස ක්‍රමය අනුව සීගිරිය හා තම්බපණ්ණි වැනි ඓතිහාසික ස්ථාන රජරට පළාතට අයත් වුව ද වර්තමානයේ ඒවා උතුරු මැද පළාතට අයත් වන්නේ නැත.


උතුරු මැද පළාත වර්ග කිලෝමීටර් 10714ක භූමියක් පුරා පැතිර පවතින අතර මෙය ශ්‍රී ලංකාවේ විශාල ම පළාතයි. එමෙන් ම රටෙහි සමස්ත භූමි ප්‍රමාණයෙන් 16.31 ක ප්‍රතිශතයක් මෙම පළාත මඟින් ආවරණය කරයි. මෙම පළාත අනුරාධපුර (වර්ග කිලෝමීටර 7128) හා පොළොන්නරුව (වර්ග කිලෝමීටර 3403) යන ප්‍රධාන පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් ද, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස 29 කින් ද, ග්‍රාම නිලධාරී කොට්ඨාස 989 කින් ද, අනුරාධපුර මහනගර සභාව හා මෑත කාලයේ ස්ථාපනය කළ පොළොන්නරුව මහනගර සභාව යන නගර සභා 02 කින් ද සමන්විත වේ (විමලරතන 2000). උතුරු මැද පළාතේ පෞරාණික, ප්‍රමුඛ රාජධානි දෙකෙහි පිහිටීම අනුව යමින් දිස්ත්‍රික්ක දෙක හා නගරසභාවන් දෙක පිහිටුවා ඇත. මහනගර සභාව අදාළ දිස්ත්‍රික්කයේ ශීර්ෂය ලෙස සැලකේ. මෙම රාජධානි දෙක සතුව පවත්නා නටඹුන් හා පෞරාණික ආකර්ෂණයන් බොහෝමයක් මහනගර සභාවක් ආශ්‍රිතව ස්ථානගත වී ඇත.

### අනුරාධපුර රාජධානිය (ක්‍රි.පූ 4 වන සියවසයේ සිට ක්‍රි.ව 11 වන සියවස දක්වා)

අනුරාධපුරය නම් වූ පෞරාණික නගරය ඉතා සරල ග්‍රාමයක් ලෙස ආරම්භ වී ඉන් පසු ක්‍රි.පූ 6 වන සියවසෙහි විජය රජුගේ ආගමනයත් සමඟ දියුණුවට පත් වී ඇත. විජය රජුගේ එක් ඇමති කෙනෙකු වූ අනුරාධ, මල්වතු ඔයෙහි ඉවුර ආසන්නයේ ගම්මානයක් ස්ථාපනය කළ අතර එය එම කාලපරිච්ඡේදයේ දී 'අනුරාධගාම' ලෙස හඳුන්වනු ලැබී ය. ක්‍රි.පූ 437 වන සියවසේ දී පණ්ඩුකාභය රජු විසින් මෙම ග්‍රාමය තමාගේ අගනගරය බවට පත් කර ගත් අතර අනතුරුව අවශ්‍ය පහසුකම් දියුණුකොට එය විචිත්‍රවත් නගරයක් බවට පත් කළේ ය.

"අනුරාධපුර නගරය බෞද්ධ ආගමෙහි පූජනීය සිද්ධස්ථානයක් ලෙසින් සැලකේ. ක්‍රි.පූ 3 වන සියවසයෙහි ශ්‍රී මහා බෝධියෙහි අංකුරයක් ගෙනවිත් මෙහි රෝපණය කළ අතර, අද වන විට එම බෝධිය පිහිටි ස්ථානයේ සිට ලෝහමය මන්දිරය දක්වා ම විහිදී විරාජමාන ව බැබළෙමින් පවතී" (යුනෙස්කෝ).

සිතියම 1: උතුරු මැද පළාතේ පෞරාණික නගරයන් හා නටඹුන්.




මූලාශ්‍රය: DRC පරිගණක දත්ත ගබඩාව, නිමල් ගුණතිලක, 2012, කොළඹ විශ්වවිද්‍යාලය.

මෙම නගරය අවුරුදු 1400 කට ආසන්න කාලයක් ශ්‍රී ලංකාවේ අගනගරය ලෙස ක්‍රියාත්මක වී ඇති අතර රජවරුන් 120 කට අධික ප්‍රමාණයක් මෙය තමන්ගේ පාලන මධ්‍යස්ථානය ලෙසින් යොදා ගනිමින් රට පාලනය කර ඇත. ක්‍රි.පූ. 1017 කාලය තුළ සිදු වූ දකුණු ඉන්දීය ආක්‍රමණයන් සමග මෙම රාජධානිය බිඳ වැටිණි.

වසර 1815 දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයට නතු කර ගැනීමට පෙර පළමුවන ස්වදේශික රාජධානිය වූ අනුරාධපුර රාජධානියේ සිට අවසාන ස්වදේශික රාජධානිය වූ මහනුවර රාජධානිය දක්වා ශ්‍රී ලංකාව රජවරුන් 196 ක් විසින් පාලනය කර ඇත. වර්තමානයේ අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 කින් හා ග්‍රාම නිලධාරි වසම් 694 කින් සමන්විත වේ (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012). එය කොළඹ දිස්ත්‍රික්කයෙන් කිලෝමීටර 225 ක් පමණ දුරින් පිහිටා ඇත.

**පොළොන්නරුව රාජධානිය (ක්‍රි.ව. 11 වන සියවසයේ සිට ක්‍රි.ව 13 වන සියවස දක්වා)**

අනුරාධපුර පාලන යුගයේ දී පොළොන්නරුව නගරය ආරක්ෂක බලකොටුවක් ලෙස දියුණුවට පත් වී ඇත. ක්‍රි.ව 1017 දී අනුරාධපුර රාජධානියේ බිඳ වැටීමත් සමග දකුණු ඉන්දීය පාලකයකු වූ චෝල රජු තමන්ගේ පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව නගරය තෝරා ගත් අතර ඒ සමග පොළොන්නරුව ශ්‍රී ලංකාවේ දෙවන රාජධානිය බවට පත් විය. වර්ෂ 1070 දී ශ්‍රී ලාංකික රජ කෙනෙකු විසින් පොළොන්නරුව රාජධානිය නැවත අත්පත් කර ගන්නා තෙක් මෙම රාජධානිය චෝල පාලනය යටතේ පැවති අතර ඒ කාලයෙහි හින්දු වන්දනාමාන මෙම

රාජධානිය තුළ ප්‍රචලිත විය. නැවත වරක් සිදු වූ දකුණු ඉන්දීය ආක්‍රමණ හේතුවෙන් සිංහල ජනාවාසකරණය ක්‍රි.ව 1232 දී පොළොන්නරුවේ සිට දඹදෙණිය දක්වා විතැන් වූ අතර ඉන් අනතුරු ව නැවත වරක් එය උතුරු මැද පළාතට පැමිණියේ නැත. වර්තමානයේ පොළොන්නරුව දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07 කින් ද ග්‍රාම නිලධාරී වසම් 295 කින් ද සමන්විත වේ (ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව). එය කොළඹ නගරයෙන් කිලෝමීටර් 216 ක් පමණ දුරින් පිහිටා ඇත.

## උතුරු මැද පළාතෙහි දේශගුණ හා සමාජ ආර්ථික පසුබිම

සාමාන්‍යයෙන් උතුරු මැද පළාතෙහි වියළි හා උෂ්ණාධික කාලගුණ තත්ත්වයක් පැවතිය ද ඇතැම් සෘතුන්හි වෙනස් වූ කාලගුණික තත්ත්වයක් පවතී. 2007-2011 කාල පරිච්ඡේදය තුළ මෙම ප්‍රදේශයට වර්ෂාපතනය ලැබුණු දින ගණනෙහි සාමාන්‍ය දින 99 ක් වන අතර එම කාලය තුළ සාමාන්‍ය වර්ෂාපතනය මි.මි. 485 ක් ලෙස වාර්තා විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2011). අවුරුද්ද තුළ වැඩි ම වර්ෂාපතනයක් ලැබෙන්නේ ඔක්තෝබර් හා ජනවාරි යන කාලය තුළ ය. වර්ෂා කාලය තුළ හරිතවත් පරිසරය, ජලයෙන් හා නෙලුම්, මානෙල් ආදී මල්වලින් පිරී ඇති දහස් ගණනක් වූ වැව් මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන අතිරමණීය දසුනකි. වැසි ජලයෙන් හා වැව් ජලයෙන් යන අංශ දෙකෙන් ම කෘෂිකාර්මික වගාවන් මෙම ප්‍රදේශයේ සිදු කරයි. මෙම කාලය පළාතේ හොඳ ම වගා කාලය මෙන් සමස්ත දිවයිනට ම හොඳ ම වගා කාලය ලෙස සැලකේ. දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා මෙම ප්‍රදේශයේ පහළ උෂ්ණත්වයක් පවතී.

දිවයිනේ සංචාරකයන් වඩාත් පැමිණෙන කාල පරිච්ඡේදය නොවැම්බර් සිට මාර්තු වන අතර මෙම කාලය උතුරු භූගෝලාර්ධයේ සිසිර කාලය වන බැවින් දිවයිනේ හොඳ ම කාලගුණික තත්ත්වය ඇති කාලය වේ. උතුරු මැද පළාත ද ඇතුළුව සමස්ත දිවයිනේ ම සාමාන්‍ය උෂ්ණත්වය මෙම කාලයේ අඩු අගයක් ගනී. දෙසැම්බරයේ සිට පෙබරවාරි මැද දක්වා දිවයිනේ මෘදු ශීත කාලය ලෙස සැලකිය හැකිය. මෙම කාලයේ පැමිණෙන සංචාරකයන්ට උතුරු මැද පළාත ද (වැසි සහිත වුවකි) ස්වභාවිකව ම සුව පහසුව දනවයි.

වගුව 3: උතුරු මැද පළාතේ කාලගුණික තත්ත්වය

| කාලගුණ සාධකය | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්තැ. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය මාසික වර්ෂාපතය. (මි.මි) | 201.8 | 96.3 | 36.7 | 113.7 | 65.8 | 21.2 | 39.6 | 77.7 | 77.4 | 216.1 | 382.4 | 323.9 |
| සාමාන්‍ය මාසික උෂ්ණත්වය. (සෙල්සියස් අංශක) | 25.1 | 25.8 | 27.6 | 28.6 | 29.0 | 28.7 | 28.0 | 27.9 | 27.3 | 27.3 | 26.1 | 25.1 |

මූලාශ්‍රය: DRC පරිගණක දත්ත ගබඩාව, නිමල් ගුණතිලක, 2014, කොළඹ විශ්වවිද්‍යාලය.

උතුරු මැද පළාතේ අතිමහත් බහුතර ජනගහනය සිංහල ප්‍රජාවට සහ බෞද්ධ ආගමට අයත් වූවෝ වෙති. ජාතික දත්තවලට අනුව දෙවන ප්‍රධාන ජනවාර්ගික ආගමික ප්‍රජාව මුස්ලිම් වන අතර දෙමළ හින්දු ප්‍රජාව සුළුතර අගයක් ගනී. පළාතේ ඉතිහාසමය පසුබිම පිළිඹිබු කරමින් සිංහල බෞද්ධ සංස්කෘතිය ප්‍රධාන වන අතර සංස්කෘතිකමය සංචාර ව්‍යාපාරය, නිසගයෙන්

ම සිංහල-බෞද්ධ ප්‍රධාන වේ.

## උතුරු මැද පළාතේ ආගමික හා සංස්කෘතික සංචාරක විභවතාවය

මිනිසුන් තම වාසස්ථානයෙන් දුරබැහැර ප්‍රදේශවලට චාරිකා කරනුයේ නොදන්නා, නුහුරු ජනයාගේ හැසිරීම් රටාවන්, ඔවුන් ජීවත්වන පරිසරයන්, ආහාර පාන, විශ්වාසයන්, පූජාවිධි, ඓතිහාසික උරුමයන්, චිත්‍ර, සංගීත, නර්තන හා උගත් විද්වත් පරිශීලනයන් පිළිබඳ ඇති ස්වාභාවික කුතුහලය සංසිඳුවා ගැනීම සඳහා ය. සංස්කෘතිය තරම් සංකීර්ණ ප්‍රවර්ධනයක් තවත් නැති තරම් ය. යම් සමාජයක සංස්කෘතිය යනු එහි ඇති සියල්ල වේ. නමුත් සංස්කෘතිය සංගීතයට, නර්තනයට, කලාවට හෝ සිනමාවට පමණක් සීමා නොවන අතර විවාහ චාරිත්‍ර, අවමංගල්‍ය චාරිත්‍රවිධි, පූජ්‍ය නගරවලට යන වන්දනා ගමන්වල රටාවන්, දරුවන් හදාවඩා ගැනීමේ පන්නයන්, වැඩිහිටියන්ට සලකන ආකාරය සහ එදිනෙදා ජීවිතයේ ඇති නොයෙකුත් අංශයන් සංස්කෘතිය යන සංකල්පයේ ගෙතී ඇමිණී ඇත (Lalvinay, 2012).

පුරාතනයේ සිට ශ්‍රී ලංකාව එහි උපාය මාර්ගික පිහිටීම, ආගමික, සංස්කෘතිකමය හා ස්වාභාවික ආකර්ෂණයන්, කුළුබඩු හා වටිනා පාෂාණ හේතුවෙන් සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉහළ කීර්ති නාමයක් දිනා ඇත. ව්‍යවහාරයට අනුව ශ්‍රී ලංකාවේ ඉතිහාසය ක්‍රි.පූ 544 දී ඊසාන දිග ඉන්දියාවේ, බෙංගාලයේ රාජකීය ආර්ය පවුලකින් පිටුවහල් කරන ලද විජය කුමාරයාගේ අනපේක්ෂිත එහෙත් වැදගත් ආගමනයෙන් ආරම්භ වූවකැයි සැලකේ (Brohier, 1982). එමෙන් ම ක්‍රි.පූ 3 වන සියවසයේ දී ඉන්දියාවේ අශෝක අධිරාජයාගේ පුත් මහින්ද රහතන්වහන්සේ විසින් ලංකාවේ උතුරු මැද පළාතේ මිහින්තලයට ධර්මදූතයන් පිරිසක් සමඟ විත් බුදුදහම ව්‍යාප්ත කළ බව කියැ වේ. කාන්තා ප්‍රව්‍රජිත බෞද්ධ සංඝයා ඇති කරනු වස් මහින්ද මහරහතන්වහන්සේගේ සොයුරිය වූ සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ තවත් තෙරණින් වහන්සේලා කිහිප නමක් සමඟ අනුරාධපුරයට වැඩම කළ සේක. ඒ සමඟ ඇය සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත් වූ බෝධීන් වහන්සේගේ අතු ශාඛාවක් ද ගෙනැවිත් අනුරාධපුරයේ රෝපණය

වගුව 4: උතුරු මැද පළාතේ ජනවර්ගික හා ආගමික ජනගහනයන්

| | ස්ථානය | ජන වර්ගය | | | |
|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | ශ්‍රී ලාංකික මුවර් | වෙනත් |
| 1 | අනුරාධපුර දිස්ත්‍රික්කය | 91.0 | 00.6 | 8.2 | 0.2 |
| 2 | පොළොන්නරුව දිස්ත්‍රික්කය | 90.7 | 01.6 | 7.4 | 0.1 |
| 3 | ශ්‍රී ලංකාව | 74.9 | 15.3 | 9.3 | 0.5 |

| | ස්ථානය | ආගම | | | | |
|---|---|---|---|---|---|---|
| | | බෞද්ධ | හින්දු | ඉස්ලාම් | ක්‍රිස්තියාන් | වෙනත් |
| 1 | අනුරාධපුර දිස්ත්‍රික්කය | 90.1 | 00.4 | 8.3 | - | 1.2 |
| 2 | පොළොන්නරුව දිස්ත්‍රික්කය | 89.1 | 01.7 | 7.5 | - | 1.1 |
| 3 | ශ්‍රී ලංකාව | 70.1 | 12.6 | 9.7 | 6.2 | 1.4 |

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ජන හා නිවාස සංගණනය, 2011

කළහ. ක්‍රි.ව 4 වන සියවසයේ දී ඉන්දියාවෙන් හේමමාලා කුමරිය හා දන්ත කුමරු විසින් වත්මනේ මහනුවර දළදා මාළිගාවේ තැන්පත් කර ඇති දන්ත ධාතූන් වහන්සේ ද වැඩම කර වූයේ අනුරාධපුරයට ය (Geiger, 1950). උසස් ශිෂ්ටාචාරයකට අත්තිවාරම් දැමූ මෙම කාල පරිච්ඡේදය අද උතුරු මැද පළාතේ සංස්කෘතිමය විභවතාවය ඉහළ නැංවීමට හේතු වී ඇත.

වගුව 5: ආගමික හා සංස්කෘතිකමය සංචාරක විභවතාවය - උතුරු මැද පළාත

| | ස්ථානය | විස්තරය |
|---|---|---|
| 1. | පුරාණ ආගමික ස්ථානවලට වන්දනා ගමන් යාම | අනුරාධපුර, මිහින්තලේ, තන්තිරිමලේ, අවුකන, පොළොන්නරුව, රිටිගල සහ උතුරු මැද පළාතේ පිහිටි පෞරාණික වෙනත් ස්ථාන මෙහි දී අතිශයින් වැදගත් වේ. මීට අමතරව අලුතින් ගොඩ නංවන ලද ආගමික ස්ථාන රැසක් මෙම පළාතේ පවතී. තම අධ්‍යාත්මික ගුණවගාව දියුණු කර ගැනීම සඳහා බෞද්ධයින්ට මෙන්ම බුදු දහම කෙරෙහි ඇල්මක් දක්වන්නන්ට මෙම ස්ථානවලට වන්දනා ගමන් යා හැකි ය. දේශීය බැතිමතුන් හා එක් ව යම් යම් ආගමික පිළිවෙත් ද සිදු කිරීමේ හැකියාව ඔවුන්ට මේ හරහා හිමි වේ. |
| 2. | ඓතිහාසික ස්ථානවලට හා කෞතුකාගාරවලට යාම | පළාතේ බොහෝමයක් ඓතිහාසික ස්ථානවල පුරාණ ශ්‍රී ලංකාවේ ආගමික, ආර්ථික, සමාජීය, දේශපාලනික හා යුධමය ඉතිහාසය ඇගයිය යුතු මට්ටමින් සංරක්ෂණය කර තිබේ.<br>මෙම ඓතිහාසික ස්ථානවලින් ප්‍රශ්න ඇසීමට ලැදි අමුත්තකුට ගවේෂණයට හා ඉගෙනීමට හැකිය.<br>උතුරු මැද පළාතේ ඓතිහාසික ස්ථානවල කෞතුකාගාර විශාල ප්‍රමාණයක් ඇති අතර ඒවායින් එම ස්ථාන පිළිබඳ හොඳ දැනුමක් ලබාදෙනු ඇත.<br>නිදසුන්: පුරාවිද්‍යා කෞතුකාගාරය, ඉසුරුමුණි කෞතුකාගාරය, අනුරාධපුර ගැමි කෞතුකාගාරය, තන්තිරිමලේ කෞතුකාගාරය, මිහින්තලේ කෞතුකාගාරය හා වෙහෙරගල කෞතුකාගාරය |
| 3. | ආගමික චාරිත්‍රවිධි බලාගැනීම | දේශීය ජන ජීවිතයේ ප්‍රමුඛ ස්වභාවය අවබෝධ කරගැනීමට දරන වෑයමේ දී කෙනෙකුට කෙටි කාලයක් බෞද්ධ ආගමික පූජාවිධි අධ්‍යයනය කිරීම කළ හැකි ය.<br>ජනප්‍රිය බෞද්ධ භාවනා ක්‍රම මෙම ඓතිහාසික ස්ථානවල දී අත්හදා බැලීමට අවස්ථාව ලැබෙන අතර ඉන් සිහිය හා අවධානය දියුණු කර ගැනීමට හැකියාව ලැබේ. මේ සඳහා නොයෙකුත් සංවිධාන ඇති අතර භාවනාක්‍රම සහ යෝග ක්‍රම ද ප්‍රායෝගිකව අත්හදා බැලිය හැකිය. |
| 4. | උත්සව | ජුනි (පොසොන්) මාසය අනුරාධපුරයේ හා මිහින්තලේ ආගමික උත්සව, පූජා විධි හා ප්‍රීති උත්සවය බහුල කාලයකි. පෝය දිනයේ හා ඒ කාලය තුළ මිලියන ගණනක් බැතිමතත්හු මෙම ඓතිහාසික ස්ථානවලට එක්රොක් වී මහින්ද මහරහතන් වහන්සේ සමඟ ලක්දිවට පැමිණි බුදු දහම හා ඒ හා බැඳි නව සංස්කෘතිය අනුස්මරණය කරති.<br>අනෙකුත් දිනවලදී ද වෙනත් ආගමික උත්සව බෞද්ධ සිද්ධස්ථාන හා බැඳී පවතී.<br>අප්‍රේල් මැද භාගයේ දී පවත්වන නව අවුරුදු උළෙල දිවයිනට ම ඉතා වැදගත් වේ. එය ජන ක්‍රීඩා, ජන නැටුම්, ජන ගී සහ ආගමික පූජා විධිවලින් සමන්විත වේ. සෑම සිංහල හා දමිළ නිවසක ම පාහේ ස්වදේශීය ඇඳුමින් සැරසී දේශීය රසකැවිලි සෑදීම මෙම නව අවුරුදු සමයේ දැකිය හැකි ය. |

| | ස්ථානය | විස්තරය |
|---|---|---|
| 5. | චාරිත්‍රවිධි සහ පූජාවිධි | උතුරු මැද පළාතේ විවිධ චාරිත්‍රවිධි හා පූජා විධි පවතී. ඉන් එකක් නම් ශ්‍රී මහා බෝධියට අලුත් සහල් පිදීම යි. බෞද්ධ හිමිවරුන්ගේ මෙහෙයවීම යටතේ ප්‍රදේශයේ ගොවියෝ මහ කන්නයේ වී අස්වැන්නේ අග්‍ර කොටස අප්‍රේල් මාසයේ දී ජය ශ්‍රී මහා බෝධියට පූජා කරති. ශ්‍රී මහා බෝධිය අසල තැබූ විශාල බඳුනක් උතුරා යන තුරු තම කුඩා බඳුන්වලින් තම තමන්ගේ අස්වැන්නේ අග්‍ර කොටස පිදීම මෙහි දී සිදුවේ.<br>ජූලි හා ඔක්තෝම්බර් පොහොය දින අතර යෙදෙන වස් කාලයේ දී ප්‍රදේශයේ සෑම ගමක ම ඇති සෑම පන්සලක ම විවිධ පූජාවිධි පැවැත්වේ. වස් කාලය, ගිහි පක්ෂය විසින් පැවිදි පක්ෂයට සිය කෘතගුණ සැලකීම පිළිබිඹු කරමින් සිවුරු හා අනෙකුත් අත්‍යවශ්‍ය දෑ පුදන කඨින පිංකම හා සබැඳේ.<br>මීට අමතරව විවිධ දෙවිවරුන්, දේවතාවියන් වෙනුවෙන් ගොඩනැගුණු බෞද්ධ සිද්ධස්ථාන ගණනාවක් පවතී. උතුරු මැද පළාතේ ප්‍රබල වටිනාකමක් ලබා ඇති මේ සුවිශේෂී චරිත වෙනුවෙන් වාර්ෂිකව හා සාමයිකව සිදුවන පූජාවිධි ක්‍රම රැසක් පවතී. මෙම චරිත තම පෙර ජීවිතවල දී කරන ලද දානමය, ශීලමය හා භාවනාමය පුණ්‍යකර්මයන් හේතුවෙන් විශාල කුසලයන් සහිත අදෘශ්‍යමාන බලවත් චරිත ලෙස හඳුනාගැනේ. ඉතිහාසයේ විවිධ අවස්ථාවල මිනිසුන්ගේ සුබසාධනය වෙනුවෙන් අසාමාන්‍ය මෙහෙයක් සිදු කළ විශේෂ ගුණදහම්වලින් පිරිපුන් මිනිසුන් ඔවුන්ගේ මරණයෙන් පසුව දේවත්වයට පත් කොට වන්දනාමාන කරයි. බොහෝමයක් මෙවන් වන්දනා ක්‍රම ඉන්දියාවෙන් ආරම්භ වූ බව සැලකිය හැකි ය. විවිධ රජවරු ද මෙයාකාරයෙන් වන්දනාමානවලට ලක වේ. විශේෂයෙන් ම පිටිසර ග්‍රාමීය පළාත්වල උපතේ සිට අකුරු කියැවීම, මල්වරවීම, විවාහය, මරණය හා අවමංගල්‍යය විශාල වශයෙන් ආගමික කෘත්‍යයන් හා බැඳී පවතී. |
| 6. | ආගමික හා වික්‍රමාන්විත සංචාරක ව්‍යාපාරය | හුදකලා කඳු පන්තියක් වන රිටිගල, කඳු ආශ්‍රිත ගවේෂණයන් සහ සංස්කෘතිමය හා ආගමික සංචාරක ව්‍යාපාරයට අගනා ස්ථානයකි. |
| 7. | කෘෂිකර්මය හා බැඳි සංස්කෘතික සංචාර ව්‍යාපාරය | උතුරු මැද පළාතේ ප්‍රධානතම ජීවිකාව වනුයේ කෘෂිකර්මයයි. අදටත් පළාතේ කෘෂිකාර්මික භාවිතයන්, සංස්කෘතිකමය හා පූජා විධිවලින් සමන්විත වේ. මෙවැනි භාවිතයන් විමර්ශනය කිරීමට පෙබරවාරි හා අප්‍රේල් අතරට යෙදෙන ප්‍රධාන අස්වනු කැපීමේ කාලය ඉතා වැදගත් වේ. |
| 8. | ආගම් හා ආයුර්වේදය | මෙම පළාතේ ආයුර්වේදය ද බෞද්ධ සංස්කෘතිය හා බැඳී පවතින්නකි. ඉතා කාර්යක්ෂමව කායික හා මානසික ආබාධයන්ට ප්‍රතිකාර කරනු ලැබේ. මෙම සම්ප්‍රදාය පිළිබඳ සංචාරකයන් දැනුවත් කිරීම සඳහා ප්‍රසිද්ධ හා විශ්වාසවන්ත ආයුර්වේද වෛද්‍යවරු පළාතේ විසිරී සිටිති. |
| 9. | සාම්ප්‍රදායික ආහාර | පළාතට ආවේණික සම්ප්‍රදායික ආහාර වට්ටෝරු රැසක් පවතී. නමුත් ඇතැම් ආහාර සෘතුමය වේ. ඕලුහාල් හා කුරක්කන්, අලවර්ග, එළවලු, විවිධ ආකාරයේ රසකැවිලි වර්ග සුලබ ය. |
| 10. | ගම්මානවල සංචාරය කිරීම. | වැව්, ඇල මාර්ග, කුඹුරු, ගෙවතු, බෞද්ධ පන්සල්, දේවාල, කැළෑ අඩිපාරවල්, කමත් හා ගම් සම්බන්ධ කරන බොරලු පාරවල් මෙම පළාතේ ඇති ප්‍රධාන ලක්ෂණයන් වේ. සම්ප්‍රදායානුකූල සංස්කෘතිය හා ආගමික උරුමයන් අදටත් ඇතැම් ගම්වල ඉතිරි වී ඇති අතර මෙවැනි දෑ සංචාරකයන්ට විමසා බැලිය හැකි ය. |
| 11. | යුනෙස්කෝ - ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ චාරිකාව | අනුරාධපුරය - පොළොන්නරුව - මහනුවර යා කරන ත්‍රිකෝණාකාර ප්‍රදේශය ශ්‍රී ලංකාවේ සංස්කෘතියක ත්‍රිකෝණය ලෙස හඳුනාගැනේ. සීගිරිය බලකොටුව, දඹුල්ල, ගල් විහාරය, මිහින්තලේ, රිටිගල, අවුකන ආදී ඓතිහාසික ස්ථාන රැසක් මෙම ප්‍රධාන ස්ථානවලට අමතරව පිහිටා ඇත. පෞද්ගලික සංචාරක ව්‍යාපාරිකයන් සුවපහසු සංචාරක සැලසුම් ඉදිරිපත් කර තිබේ. විවිධ ආකාරයේ සංචාරක නවාතැන්පොළවල් මෙම පළාතේ විශාල වශයෙන් ඇත. |

## උතුරු මැද පළාතේ ඉහළ ම ආගමික හා සංචාරක විභවතාවයක් ඇති ඓතිහාසික ස්ථාන

### අනුරාධපුරය (ලෝක උරුම නගරය - යුනෙස්කෝ)

ක්‍රි.පූ. 4 වන සියවසේ සිට ක්‍රි.ව. 11 වන සියවස දක්වා පුරාණ ශ්‍රී ලංකාවේ අගනගරය වූයේ අනුරාධපුරය නමැති පූජනීය බෞද්ධ නගරයයි. මෙම නගරය වර්ග කිලෝමීටර 40 කට වඩා වැඩි භූමි ප්‍රදේශයක පැතිරී ඇත. ක්‍රි.පූ. 236 දී දේවානම්පියතිස්ස රජු මෙම නගරය, තම රාජධානියේ අගනුවර ලෙස පවත්වාගෙන ගිය සමයේ ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයා විසින් බුදු දහම හඳුන්වාදෙන ලදී. මෙම නගරය කොළඹින් කිලෝමීටර 250 ක් පමණ දුරකින් උතුරු මැද පළාතේ පිහිටා ඇත. මෙය ලෝකයේ පැරණිත ම නටඹුන් සහිත නගරවලින් එකක් ලෙස හඳුනාගෙන ඇත.

දිවයිනේ පවත්නා බොහෝමයක් වැව් අනුරාධපුර හා පොළොන්නරු රාජධානිවල රජ කළ පුරාණ රජවරුන් විසින් ගොඩ නංවන ලද ඒවා ය. වර්තමානයේ මැටියෙන් සැලිවළං ආදිය සාදන රැකියාවන් හා සමානව එකල ශෛලමය කැටයම් හා අනෙකුත් භාවිතාවන් බහුල වූ බව පෙනේ. මුළු භූමිය ම කැටයම් කරන ලද කපන ලද ගල්වලින් සමන්විත අතර වැව්වල බිසෝකොටු ද එම දිගුකාලීන මාධ්‍යයෙන් ම නිමවූයෙන් අදටත් ඉතිරි ව පවතී (පරිපාලන වාර්තාව, 1870).

වගුව 6: අනුරාධපුර නගරයේ තෝරාගත් ආගමික ස්ථාන හා නටඹුන් කිහිපයක්

| | ස්ථානය | විස්තරය |
|---|---|---|
| 1. | ශ්‍රී මහා බෝධින් වහන්සේ | ඉන්දියාවේ බුද්ධගයාවේ, අද බිහාර ප්‍රාන්තයේ පවතින පූජනීය බෝ වෘක්ෂය ක්‍රි.පූ 563-483 කාලයේ දී සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත්වූ බෝධිය වේ. ක්‍රි.පූ 249 දී එම බෝධියේ අංකුරයක් ශ්‍රී ලංකාවේ අනුරාධපුරයේ රෝපණය කරන ලදී. එය දැනට ලොව පවත්නා මිනිසුන් විසින් රෝපණය කරන ලද පැරණි ම වෘක්ෂය යි. |
| 2. | ථූපාරාමය චෛත්‍යය | බුදුන් කල ලක්දිව පිහිට වූ මහියංගණ හා තිරියාය ස්ථූප පිළිබඳ තොරතුරු ඇතත් ලක්දිවට බුදු දහම ලද විගස ක්‍රි.පූ 3 වන සියවසේ දී දේවානම්පියතිස්ස රජු විසින් ගොඩනැංවූ ප්‍රථම ස්ථූපය වේ. |
| 3. | රුවන්වැලි චෛත්‍යය | දුටුගැමුණු රජු විසින් (ක්‍රි.පූ 161 - ක්‍රි.පූ 137) වටප්‍රමාණය මීටර 290 කිනුත් උස මීටර 91.4 කිනුත් යුතුව ගොඩනංවන ලද ලොව පවත්නා උස ම චෛත්‍ය අතරින් එකකි. |
| 4. | ජේතවන චෛත්‍යය | ගඩොලින් තනන ලද ලොව උස ම චෛත්‍යය වේ. බිම ගඩොල් අතුරන ලද චෛත්‍යය දරා සිටිනා වේදිකාව භූමියෙන් අක්කර 8 කට (හෙක්ටයාර 3 කට) වැඩි ය. උසින් මීටර 121.9 ක් වන ලංකාවේ හා පැරණි ලෝකයේ උසම ස්ථූපයයි. මහසෙන් රජු (ක්‍රි.ව 273 - ක්‍රි.ව 301) සහ ඔහුගේ පුත් මේඝවර්ණ විසින් මෙය ගොඩනංවන ලදි. |
| 5. | අභයගිරි ආරාමය සහ ස්ථූපය | මෙම ආරාමය සහ ස්ථූපය වලගම්බා රජු (89-77 ක්‍රි.පූ) විසින් ගොඩනංවන ලදි. ථෙරවාදී බුදු දහම හැර අනෙකුත් නිකායන්වලට මෙම ආරාමය විද්වතුන්ගේ මධ්‍යස්ථානයක් විය. 5 වන සියවසේ දී ෆාහියන් නම් චීන ජාතික භික්ෂුව මෙම ස්ථානයේ භික්ෂුන් වහනසේලා 5000 ක් පමණ සමඟ ජීවත් ව සිට ඇත. |

| | ස්ථානය | විස්තරය |
|---|---|---|
| 6. | ෆාහියන් සහ අභයගිරි කෞතුකාගාරය | ෆාහියන් භික්ෂුව බෞද්ධ ආගමික - ධර්ම ග්‍රන්ථ සොයමින් ක්‍රි.ව 410 දී පමණ අනුරාධපුරයට පැමිණි චීන ජාතික භික්ෂුවකි. මහානාම රජ දවස එතුමා අභයගිරි විහාරයේ වසර 2 ක් පමණ ජීවත් ව ඇත. ෆාහියන් භික්ෂුව වසර 65 දී එනම් ක්‍රි.ව 399 දී චීනය අතහැර ධර්ම චාරිකා අරඹා ඇත. වසර 14 ක චාරිකාවකින් පසු වසර 79 දී යළි චීනයට පැමිණ ඇත. ඔහුගේ නැවත පැමිණීමෙන් පසු ඉන්දියානු බෞද්ධ හිමිනමක් වන බුද්ධබන්ද්‍ර නම් හිමියන්ගේ සහාය ඇති ව බෞද්ධ ධර්ම ග්‍රන්ථයන් චීන භාෂාවට පරිවර්තනය කරන ලදී. |
| 7. | කුට්ටම් පොකුණ | අග්ගබෝධි රජු ( ක්‍රි.ව 575 - 608) විසින් බෞද්ධ භික්ෂූන්ගේ පැන් පහසුව සඳහා මෙය නිර්මාණය කරන ලදී. පොකුණු දෙකෙහි ම පතුල නල පද්ධතියක් හරහා සම්බන්ධ කර ඇති අතර  මෙම පොකුණු දෙක සඳහා අවශ්‍ය ජලය භූ ගත ජල නල පද්ධතියක් මගින් සපයනු ලැබේ. ජලය මුලින් ම පරිමාවෙන් (මීටර් 40.6 X මීටර් 15.6) විශාල පොකුණට මකර කටකින් වැටෙන අතර ඉන් අනතුරු ව පරිමාවෙන් අඩු පොකුණට ජලය ඒ හරහා සපයනු ලැබේ. |
| 8. | ඉසුරුමුණි පෙම් යුවල | දේවානම්පියතිස්ස රජු විසින් නිර්මාණය කරනු ලැබූ ඉසුරුමුණිය ප්‍රකට වන්නේ එහි ඇති පෙම් යුවලගේ ගල් කැටයම නිසා ය. ඉසුරුමුණිය පෙම් යුවල ගල් කැටයමෙන් නිරූපණය වනුයේ දුටුගැමුණු රජුගේ පුත්‍රයා වන සාලිය කුමාරයාත්, ඔහුගේ පෙම්වතියත් බව බොහෝදෙනා සඳහන් කරති. සාලිය කුමරා සිය පෙම්වතිය පහත් කුලයට අයත් තැනැත්තියක් නිසා  ඔටුන්න අත්හළ බව ද සඳහන් ය. |
| 9. | ලෝවාමහාපාය | මහල් නවයකින් සමන්විත වන ලෝවාමහාපාය දුටුගැමුණු රජතුමා විසින් බෞද්ධ  භික්ෂූන් උදෙසා නිර්මාණය කර ඇත. මෙය ලෝහ ප්‍රාසාදය ලෙස ද හඳුන්වනු ලැබේ. ඓතිහාසික තොරතුරුවලට අනුව මෙම ගොඩනැගිල්ල මීටර් 47 ක උසින් ද, මීටර් 46 ක් වූ එක සමාන දිගින් සහ පළලින් ද සමන්විත වෙයි. මෙම ගොඩනැගිල්ල ගල් කුළුණු 1600 ක ආධාරයෙන් මුල දී ස්ථාපිත කර ඇත. |
| 10. | අනිකුත් වැදගත් ස්ථාන | මිරිසවැටිය චෛත්‍යය, සමාධි බුදු පිළිමය, පුරාවිද්‍යා කෞතුකාගාරය, රාජකීය මාළිගාව, ගල්වල කොටනු ලැබූ සෙල්ලිපි සහ අනුරාධපුර ප්‍රදේශය තුළ දැකිය හැකි නටබුන් ද මෙහි ලා සුවිශේෂී ලෙස දැක්විය හැකි ස්ථාන අතරින් කිපයකි. |

**මිහින්තලය**

මිහින්තලය, වර්තමානයේ තරමක් නාගරික පහසුකම් සහිත වූ තරමක් විශාල ග්‍රාමීය ප්‍රදේශයකි. කොළඹ සිට කිලෝමීටර් 221 ක දුරින් ද, UNESCO ලෝක උරුමයක් ලෙස සැලකෙන අනුරාධපුර නගරයට කිලෝමීටර් 12 දුරින් ද, උතුරු මැද පළාතට වන්නට මිහින්තලය පිහිටා ඇත. මිහින්තලය ද ශ්‍රී ලාංකීය බෞද්ධ ජනතාවගේ මෙන් ම බොහෝ සංචාරකයන්ගේ ද ගෞරවාදරයට පත් වූ ස්ථානයකි. "මිස්සක පබ්බත" ලෙස ද මිහින්තලය හඳුන්වයි. මිහින්තලය කඳුවැටිය ප්‍රධාන ලෙස ම අම්බස්තලය, රාජගිරි සහ අනායිකුට්ටි නැමැති ප්‍රධාන කඳු තුනකින් සමන්විත වේ. ක්‍රි.පූ 3 වන සියවසයේ දී ශ්‍රී ලංකාවට මුලින් ම බුදු දහම පිළිබඳ පණිවිඩය ගෙන ආවේ අධිරජ ධර්මාශෝකගේ පුත්‍රයා වන මිහිදු මහරහතන් වහන්සේ විසිනි. එවකට ශ්‍රී ලංකාව පාලනය කළ දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ 307-266) පළමුවෙන් බුදු දහම වැළඳගත් ශ්‍රී ලාංකිකයා බවට පත් වූයේ වර්තමානයේ අප විසින් වන්දනාමාන කරනු ලබන මිහින්තලය පුද බිම ප්‍රදේශයේ දී ය. වර්තමානයේ දී ද බොහෝමයක් බෞද්ධ සැදැහැවතුන් විශාල පිරිසක් පොසොන් පොහොය දිනට මිහින්තලය වැඳ පුදා ගැනීමට පැමිණෙනු දක්නට ලැබේ.

වගුව 7: මිහින්තලයෙහි දැකිය හැකි තෝරාගත් ආගමික විචිත්‍රාංග සහ නටබුන්

| | ස්ථානය | විස්තරය |
|---|---|---|
| 1. | ඉපැරණි ගිලන්හල | II වන සේන රජු විසින් (ක්‍රි.ව. 866-901) ඉදිකරනු ලැබූ ගිලන්හලක් යැයි සිතිය හැකි ආකාරයේ නටබුන් මිහින්තලය ගල පා මුල ආසන්න ප්‍රදේශයේ දැකිය හැකි ය. ඖෂධීය ශාක ඇඹරීමට භාවිත කළා යැයි සිතිය හැකි වටකුරු ගල්, එමෙන් ම ලෙඩ සුව කිරීම සඳහා ගිලනුන් බැස්ස වූ බෙහෙත් ඔරු ආදිය ද මෙම ප්‍රදේශයෙන් සොයා ගෙන ඇත. තව ද පාහියන් භික්ෂුවගේ වාර්තාවලට අනුව ද මෙම ස්ථානයේ රෝහලක් පැවැති බව සඳහන් ය. |
| 2. | ගල තුළට නැගීම සඳහා ගලින් කළ පඩිපෙළක් | වර්ෂ 1840 පමණ කාල වකවානුව තුළ කළු ගලින් දර්ශනීය ලෙස නිර්මාණය කරණු ලැබූ පඩිපෙළක් ගල් පාමුල සිට මුදුනට යෑමට තිබූ අතර නගින නගින සෑම පඩියකට ම සෙවණ සැලසීම සඳහා අරලිය ගස් ද දක්නට ලැබී ඇත. |
| 3. | කන්ඨක චෛත්‍යය ස්ථූපය | කන්ඨක චෛත්‍යය, මිහින්තලය ගලට ආසන්න ව පිහිටා ඇත. ක්‍රි.පූ. පළමුවන සියවසයේ දී සූරතිස්ස රජු විසින් මෙය නිර්මාණය කර ඇති අතර එම ස්ථූපය අඩි 40 ක උසින් ද අඩි 425 ක වට ප්‍රමාණයකින් ද සමන්විත වේ.එම ස්තූපයේ ඇති සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ නිසා එය බොහෝ ලෙස ප්‍රචලිත ය. |
| 4. | අම්බස්තලය චෛත්‍යය | මෙම චෛත්‍යය නිර්මාණය කර ඇත්තේ මිහිඳු මහරහතන් වහන්සේගේ භස්මාවශේෂයන් තැන්පත් කිරීමෙන් ය. එමෙන්ම එය මිහින්තලය ගල මුදුනට ආසන්න තැනිතලාවක පිහිටා ඇත. |
| 5. | ආරාධනාගල | භික්ෂුන් වහනසේ විසින් භාවිත කළා යැයි සිතිය හැකි ආකාරයේ ගල්ලෙන් 60 කට අධික ප්‍රමාණයක් මෙහි ඇති අතර මිහිඳු මහ රහතන් වහන්සේ ද එක්තරා ගල්ලෙනක වැඩ විසූ බවට සාක්ෂි ලැබී ඇත. |
| 6. | අනිකුත් ඓතිහාසික ස්මාරක | පැරණි සංඝාවාසවල නටබුන්, සෙල්ලිපි, ජලාශ තිබුණු තැන්වල ඉතිරි වූ නටබුන්, දානශාලා, මන්ත්‍රණ සභා, ක්‍රීඩා මණ්ඩප තිබූ ස්ථානවල ඉතිරි වූ නටබුන්, විවිධ කැටයම්, මිහිඳු මහරහතන් වහන්සේ විසින් භාවිත කළා යැයි විශ්වාස කරන සයනය සහ අනෙකුත් විවිධ දෑ ඇත. |

**පොළොන්නරුව**

උතුරු මැද පළාතේ, අනුරාධපුරයෙන් පසු දෙවැනි විශාලත ම ඓතිහාසික නගරය වනුයේ පොළොන්නරුව යි. කොළඹ සිට කිලෝමීටර් 221 ක් දුරින් පොළොන්නරුව පිහිටා ඇත. ආක්‍රමණිකයන් අනුරාධපුර රාජධානිය විනාශ කළ පසු ශ්‍රී ලංකාවේ දෙවැනි රාජධානිය බවට පත් වූයේ ද පොළොන්නරුවයි.

**රිටිගල (අරිට්ඨ පබ්බත)**

රිටිගල, හුදකලාව පිහිටි කඳු අතරින් උස ම කඳු පන්තිය ලෙස හඳුනාගැනේ. මෙය කඳු මුදුන් හතරකින් සමන්විත ය. අනුරාධපුර නගරයේ සිට කිලෝමීටර් 43 පමණ දුරකින් පිහිටා ඇති මෙම කඳු පන්තියේ උස ම ස්ථානය මුහුදු මට්ටමේ සිට මීටර් 766 කි. එමෙන් ම වටපිටාවේ ඇති තැනිතලා ප්‍රදේශවල සිට මීටර් 600 ක උසින් පිහිටා ඇති අතර දිග ආසන්න වශයෙන් කිලෝමීටර් 4.8 පමණ වන අතර හෙක්ටයාර 1582 (අක්කර 3776) භූමි ප්‍රමාණයක් ආවරණය කරගත් සුවිශේෂී වූ ජෛව පද්ධතියක් ආරක්ෂා කරමින් රිටිගල කඳුවැටිය පිහිටා ඇත. මෙම දුර්ලභ පිහිටීම පාරිසරික මෙන් ම සංස්කෘතිකමය වශයෙන් වටිනා බැවින් සංචාරක කර්මාන්තය නගාසිටුවීමට ද මහෝපකාරී වෙයි. වැසි කාල සීමාවේදී (ඔක්තොම්බර්-ජනවාරි) මෙන් ම වියළි කාලගුණයක් සහිත කාල වකවානුවේ දී ද හවස සිට උදේ කාලය දක්වාත් මෙම කඳු පන්තියෙහි උඩ ප්‍රදේශය වලාකුළුවලින් මෙන් ම මීදුමෙන් ද වැසී පවතී.

වගුව 8: පොළොන්නරුවේ දැකිය හැකි තෝරාගත් අගමික විචිත්‍රාංග සහ නටබුන් කීපයක්.

| | ස්ථානය | විස්තරය |
|---|---|---|
| 1. | රාජකීය මාළිගය | ඓතිහාසික තොරතුරුවලට සහ මෙම ප්‍රදේශය තුළ තිබී හමු වූ නටබුන්වලට අනුව පොළොන්නරුවෙහි සියලු පහසුකම් සහිත මහල් පහකින් යුත් රාජකීය මාළිගයක් පැවැති බවට සාක්ෂි ඇත. විශේෂයෙන් ම මෙම මාළිගාවෙහි බිසෝවරුන් සඳහා වෙනම ම කුටිද, කෑම කාමර, ස්නානය කිරීම සඳහා නිර්මාණය කරනු ලැබූ වෙනම ම ස්ථාන ද තිබූ බවට සාක්ෂි ඇත. එමෙන් ම ගෙවුයන විශාල ප්‍රාකාරයකින් සමන්විත වූ අතර මෙය දොළොස්වන ශතවර්ශයේ විසූ පළමු පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයක් ලෙස සැළකේ. |
| 2. | සත්මහල් ප්‍රාසාදය | මෙහි ලා දැකිය හැකි සුවිශේෂිතම ලක්ෂණයක් වනුයේ නිතර දක්නට නොලැබෙන පිරමීඩාකාර හැඩයට චෛත්‍යයක් ලෙස නිර්මාණය කර තිබීමයි. තායිලන්තයේ සහ කාම්බෝජියාවේ මෙම දසුන සුලභ ය. එමෙන් ම මෙය රජුට සේවය සැපයූ කාම්බෝජියානු සෙබළුන් විසින් වන්දනාමාන කිරීම සඳහා නිර්මාණය කර ඇත. |
| 3. | අටදාගෙය | 11 වන සියවයේදී විජයබාහු රජු විසින් මෙය නිර්මාණය කර ඇත. අදටත් ගල් කුළුණු 54 ක් මෙන් ම සිංහලයෙන් සහ දෙමළෙන් සම්පාදිත සෙල්ලිපි දක්නට ඇත. එමෙන් ම මීටර් 3 ක් පමණ උස බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් ද දැකීම තවත් සුවිශේෂිතාවයකි. |
| 4. | ගල් විහාරය | ගලින් නෙළන ලද බුද්ධ ප්‍රතිමා වහන්සේගේ හිඳි පිළිම වහන්සේ ප්‍රතිමාවක් ද, සැතපෙන ඉරියව්වෙන් මෙන් ම හිටි පිළිමයක් ද ගල් විහාරය තුළ දක්නට ඇත. |
| 5. | ආලාහන පිරිවෙන | මෙය ක්‍රි.ව 12 වන සියවසයේ දී පරාක්‍රමබාහු රජු විසින් ඉදි කර ඇත. මෑත කාලීන ව සිදු කරනු ලැබූ ගවේශනවලින් සොයාගෙන ඇති කරුණුවලට අනුව මෙමගින් බෞද්ධ භික්ෂූන්ට අධ්‍යාපනික පහසුකම්වලට අමතරව මෙම ගොඩනැගිල්ල තුළ ම උන්වහන්සේලාට වෛද්‍ය පහසුකම් ලබාගැනීම සඳහා ආරෝග්‍ය ශාලාවක් ද තිබී ඇත. |
| 6. | හින්දු සිද්ධස්ථාන සහ ස්මාරක | පොළොන්නරුව රාජධානිය තුළ දකුණු ඉන්දියානු බලපෑම තිබූ බවට කදිම සාක්ෂි ලෙස හමුවී ඇති හින්දු සිද්ධස්ථාන දැක්විය හැකිය. එමෙන් ම ශිව දේවාලය මෙන් ම ශිව දෙවියන්ගේ සහ පාර්වතීගේ මූර්තීන් මේ අතරින් කැපී පෙනෙන දෑ වෙයි. |
| 7. | අනිකුත් ස්මාරක | නිශ්ශංකලතා මණ්ඩපය, පූජනීය චතුරස්‍රය, දාගැබ්, පුස්තකාල, ප්‍රතිමා වහන්සේලා, ක්‍රීඩා මණ්ඩප ආදීය දැක්විය හැකි ය. |

කඳු පන්තියේ පාමුල වූ තැනිතලා ප්‍රදේශවලට සාපේක්ෂව කඳු පන්තියේ ඉහළට වන්නට තරමක් අඩු උෂ්ණත්වයක් සහ තෙතමනයක් සහිත පරිසරයක් ද දැක ගත හැකි වීම මෙහි සුවිශේෂී ලක්ෂණයකි. එමෙන්ම සාරවත් වෘක්ෂලතාවලට මෙන් ම බොහෝමයක් සත්ත්ව විශේෂයන්ට ද නිවහනක් වේ.

රිටිගල ප්‍රදේශයේ දැකිය හැකි සුවිශේෂී අංග ලෙස, ක්‍රි.පූ. පළමු සියවසේ දී පමණ නිර්මාණය කරනු ලැබූ ආරාමයක නටඹුන් හෙක්ටයාර 24 ක පමණ (අක්කර 59) ප්‍රදේශයක දී දැකිය හැකි ය. එමෙන් ම එම කාල වකවානුවේදී ම භාවිත කළා යැයි විශ්වාස කළ හැකි බෞද්ධ භික්ෂූන් භාවනා කිරීම සඳහා උපයෝගි කර ගත් ගල් ලෙන් 70 කට ආසන්න ප්‍රමාණයක් ද ඇත. සෙල්ලිපි මෙන් ම මිනිසුන් විසින් භාවනා කරන බෞද්ධ භික්ෂූන්ගේ පැන් පහසුව සඳහා ජලය රැස් කිරීමට නිර්මාණය කරනු ලැබූ ජලාශවල කැඩී බිඳී ගොස් ඉතිරි වූ කොටස් මෙම ප්‍රදේශය තුළ අදට ද පවතී.

ක්‍රි.පූ 4 වන සියවයේ දී පමණ නිර්මාණය කරනු ලැබූ ඉන්දියානු වීර කාව්‍යයක් වන රාමායනයේ

රිටිගල කඳුවැටිය පිළිබඳ සඳහනක් වෙයි. ශ්‍රී ලංකාවේ විසූ ඉතා දරුණු රජකු වන රාවණා විසින් ඉන්දියාවේ විසූ විෂ්ණු දෙවියන්ගේ පෙර ආත්ම භාවයක් වන රාමා ගේ බිරිඳ, සීතාව ලංකාවට පැහැර ගෙන ආ අතර හනුමන්තා හා ඔහුගේ වානර සමූහයා ලංකාවට විත් අගනගරය ගිනිබත් කර සීතා දේවිය මෙහි සිටින බව දැක්වීමට රිටිගල කඳු මුදුනට පැමිණ පැන ගිය බවට රාමායනයෙහි දැක්වෙයි.

රිටිගල, අනුරාධපුරයට මෙන් ම සංචාරක ආකර්ෂණය දිනාගත් ප්‍රධාන ස්ථාන කීපයක් වන පොළොන්නරුව, සීගිරිය, දඹුල්ල, හබරන යන ප්‍රදේශවලට නුදුරින් පිහිටා ඇත.

### තන්තිරිමලේ

තන්තිරිමලේ, අනුරාධපුර නගරයට කිලෝමීටර් 40 නුදුරින් පිහිටි ඉතා වැදගත් බෞද්ධ පුද බිමකි. ජනප්‍රවාදවලට අනුව දුටුගැමුණු රජතුමා විසින් පිටුවහල් කරනු ලැබූ ඔහුගේ පුතු වන සාලියත්, ඔහුගේ අඩු කුලයට අයත් පෙම්වතිය වන අශෝකමාලාත් කලක් මෙම ප්‍රදේශයේ ජීවත් වී ඇත (සමාව ලැබීමට ප්‍රථම). රජු විසින් ඔවුන්ට ත්‍යාගයක් ලෙස 'තන්තිරිමාලේ'නැමැති සමනලයාගේ හැඩයෙන් යුතු රන් මාලයක් ලබා දුන් අතර පසුව මෙම ප්‍රදේශයේ නාමය තන්තිරිමලේ බවට පත් වූ බව යනප්‍රවාදයන්හි කියැවේ. එසේ ම අතීතයේ දී මෙම ප්‍රදේශය "තිවක්ක බමුණුගම" ලෙස ද හඳුන්වා ඇත.

අශෝක අධිරාජයාගේ දියණිය වන සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධියේ අංකුරයක් රැගෙන දඹකොළ පටුනට ගොඩ බැස ඉන් අනතුරුව සිය පිරිවර සමඟ අනුරාධපුරයට එන ගමනේ දී විවේකගත් ස්ථානය තන්තිරිමලය ලෙස විශ්වාස කරයි. මෙම පූජනීය භූමිය අක්කර 300 කට අධිකව ව්‍යාප්තව පවතින අතර මෙහි ආගමික වශයෙන් වැදගත් පිහිටීම් දෙකක් ඇත.

1. ගල් තලාව මත වැඩුණු බෝ ගස :-

සංඝමිත්තා තෙරණිය ජය ශ්‍රී මහා බෝ අංකුරය රැගෙන අනුරාධපුරයට වඩින ගමනේ දී සිය පිරිස සමඟ විවේක ගත් මෙම ගල් තලාව මත, එයට කරන උපහාරයක් ලෙස අෂටඵල බෝධි අංකුරයක් ගෙනැවිත් රෝපණය කළ බව වංශ කථාවන්හි සඳහන් වේ.

2. බුද්ධ ප්‍රතිමා වහන්සේ :-

මීටර් 15 ක් දිග සහ මීටර් 2.16 උස හිඳි පිළිම වහන්සේ නමක් මෙහි දක්නට ඇත. මෙම පූජනීය ස්ථාන දෙකට අමතර ව, ඉපැරණි ගොඩනැගිලි විචිත්‍ර ආලේපන සහිත ගල් ලෙන්, අසම්පූර්ණ කළු ගල්වලින් කරනු ලැබූ කැටයම් සහ විවිධ ඓතිහාසික නටබුන් මෙම ස්ථානයේ දක්නට ඇත.

### අවුකන බුද්ධ ප්‍රතිමා වහන්සේ

මෙම බුද්ධ ප්‍රතිමාව 5 වන සියවසේ දී නිර්මාණය කර ඇත. අනුරාධපුරයට නුදුරින් පිහිටි කැකිරාව නම් ගම් පියසේ, මීටර් 12 ක් පමණ උස මෙම හිටි පිළිම වහන්සේ නිර්මාණය කර ඇත. බුද්ධ ප්‍රතිමා වහන්සේ සම්පූර්ණයෙන් ම රඳවා ගැනීම සඳහා කළු ගලෙන් පටු තීරුවක් ඉතිරි කර ඇත. මෙම හිටි පිළිම වහන්සේ නෙළුම් මලක් මත සිටගෙන ඉන්නා ආකාරයක් දැකිය හැකි අතර එහි සම්පූර්ණ උස මීටර් 13 ක් පමණ වේ. එමෙන් ම ප්‍රතිමාවේ සිවුර කැටයම් කර ඇති ආකාරය අනුව එයට අමරාවතී සහ ගන්ධාර නැමැති ඉන්දියානු කලා ශිල්පවල බලපෑම ලැබී ඇති බවට පැහැදිලි වෙයි.

### උතුරු මැද පළාත තුළ සංස්කෘතික විභවයන් හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි උපායමාර්ග

අනුරාධපුරයේ සහ පොළොන්නරුවේ දැකිය හැකි නටබුන් හේතුවෙන් උතුරු මැද පළාතට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම තව දුරටත් හැකියාව ඇත. එනමුත් සැඟවී ඇති සම්පත් ද නිසි ලෙස උපයෝජනය කළහොත් සංචාරක මධ්‍යස්ථානයක් ලෙස උතුරු මැද පළාතෙන් අපට ජනනය කළ හැකි ඉපැයීම් වැඩි කර එමගින් ජාතික ආදායම ද ඉහළ නංවා ගත හැකි ය. වඩා යහපත් සමාජ ආර්ථික තත්ත්වයක්

ඇති කිරීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් මෙන් ම ඒවායේ ගුණාත්මක බවත්, සංචාරක කර්මාන්තය ප්‍රිය කරන සමාජයකුත්, පැවතීම මෙම වෑයම සාර්ථක කර ගැනීමට අත්‍යවශ්‍ය සාධක වෙයි.

මෙම සංස්කෘතික සහ ඓතිහාසික උරුමයන් මගින් සංචාරකයන්ට අවශ්‍ය දැනුම ,විනෝදය ලබා දෙනවා මෙන්ම කැපවීමෙන් ඒවා ආරක්ෂා කළ යුතුය. එමෙන්ම විවිධ සංස්කෘතික අංගයන් හරහා සාමූහික හැඟීම් ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය බෞද්ධ සමාජය තුළ පමණක් නොව සෑම ජන කොට්ඨාසයක් අතර ම වර්ධනය කිරීමට පියවර ගත යුතු වන්නේ ය.

වගුව 9: උතුරු මැද පළාත ආගමික ගමනාන්තයක් ලෙස දියුණු කිරීම සඳහා උපයෝගී කර ගත හැකි රටවල්

| | |
|---|---|
| චීනය | තායිවානය |
| ඉන්දියාව | නේපාලය |
| ජපානය | කාම්බෝජය |
| තායිලන්තය | මියන්මාරය |
| වියට්නාමය | භූතානය |
| මියන්මාරය | මොන්ගෝලියාව |
| දකුණු කොරියාව | ලාඕසය |
| සිංගප්පූරුව | ඇමරිකා එක්සත් ජනපදය |

**නිගමනය**

ශ්‍රී ලංකාව සුවිශේෂී වූ ජෛව විවිධත්වයකින් පරිපූර්ණ වූ නිවර්තන දූපතකි. පොහොසත් සංස්කෘතික උරුමයන්, බහු වාර්ගික, බහු ආගමික සමාජයන්ගෙන් ද සමන්විත ශ්‍රී ලංකාව ඉතා ආකර්ෂණීය දූපතකි. ශ්‍රී ලංකාව තුළ සුළු ජනගහනයක් සිටිය ද ආගමික සහ ඔවුන්ගේ සංස්කෘතික විවිධත්වය නිසා සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට සමත් වී ඇත. ක්‍රිස්තියානි, හින්දු වැනි ආගම් ශ්‍රී ලාංකිකයින් විසින් අදහනු ලැබුව ද බහුතරයක් අදහන ප්‍රධාන ආගම වනුයේ බුද්ධාගමයි.

ආගමික පුරුදු, ඉපැරණි ස්මාරක, ආගමික සහ සංස්කෘතික සම්පත් අතින් ඉතා පොහොසත් පළාතක් ලෙස අනුරාධපුරය සහ පොළොන්නරුව යන ඉපැරණි නගර දෙක දැකිය හැකි වනුයේ වසර දහසකට අධික කාලයක් ශ්‍රී ලංකාවේ අග නගරය ලෙස වැජඹුණ නිසාවෙනි. නමුත් මේ දක්වා සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා මෙම සම්පත්වලින් භාවිත කර ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. මෙම විවරණයෙහි මුඛ්‍ය පරමාර්ථයක් වනුයේ උතුරු මැද පළාතට ආවේණික ආගමික සහ සංස්කෘතික සාධකයක් මගින් සංචාරක කර්මාන්තය සඳහා වන මංමාවත් විවර කිරීමට ඇති හැකියාව විදහා දැක්වීම සඳහා ය.

මෙම විවරණය මගින් දැක්වෙන කරුණුවලට අනුව පෙනී යන්නේ උතුරු මැද පළාත තුළ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ දී තව දුරටත් මේ සඳහා ඇතුළත් කළ හැකි ස්ථාන අතර රිටිගල, තන්තිරිමලේ ආදී ස්ථාන යොදාගත හැකි බවයි. එමෙන් ම විවිධ ග්‍රාමීය කටයුතු බැලීම හා එමගින් සංචාරකයින්ට අත්දැකීම් ලබාදීම තුළින් ද, මෙම පළාතට සංචාරක කර්මාන්තය තුළින් ලබා ගත හැකි ලාභය වැඩි කර ගත හැකි ය.

තව ද උතුරුමැද පළාත තුළ දේශීය සංචාරක කර්මාන්තයෙහි සාර්ථකත්වය සඳහා සමාජ සහභාගීත්වය ඉතා ම වැදගත් වේ. විශේෂයෙන් ම මෙම ප්‍රදේශය තුළ ඓතිහාසික සහ

සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ දී පූජක පක්ෂයේ, රාජ්‍ය නිලධාරීන්ගේ සේවා සැපයුම්කරුවන්ගේ මෙන් ම සමස්ත සමාජයේ ම සහභාගීත්වය අවශ්‍ය වේ.

අවසාන වශයෙන් ප්‍රකාශ කළ හැකි තවත් කරුණක් වනුයේ සිංහල බෞද්ධ සම්ප්‍රදාය මෙම ප්‍රදේශය තුළ පුළුල් ලෙස ව්‍යාප්ත වී තිබුණ ද බහු ආගමික, බහු සංස්කෘතික, සාමාජීය අවශ්‍යතා පිළිගත යුතු මෙන් ම ඒවා පැවතිය යුතු ය. එමෙන් ම දේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට ද මෙම විවිධත්වය වැදගත් වේ. එමෙන්ම සංචාරක නිෂ්පාදන ආශ්‍රයෙන් සාමූහිකත්වය, වගකීම් පිළිබඳ හැඟීම් ද සෑම සමාජයක් තුළ ම වර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය කරුණකි.

## මූලාශ්‍ර ග්‍රන්ථ හා ලිපි


Administration Reports (1870). *District of Nuwarakalawiya*, CO: 57/51/1870. London: Public Record Office.

Ahmed, Sadiq, Kelegama, Saman and Ghani, Ejaz (Eds.) (2010). *Promoting Economic Cooperation in South Asia*: Beyond SAFTA, New Delhi: Sage Publication.

Brohier, R. L. (1982). *Discovering Ceylon*. Colombo: Lake House Investments Ltd.

Central Bank of Sri Lanka. (2011). *Annual Report*. Colombo

Central Bank of Sri Lanka (2013). *Annual Report*. Colombo

Department of Census and Statistics (2012), Census of Population and Housing-2011,

Department of Census and Statistics (2014), *Household Income and Expenditure Survey* 2013-13, Colombo.

DRC Database (2014). Department of Economics. Colombo: University of Colombo.

Geiger, W. (1950). *The Mahávamsa* (trans.). Colombo: The Ceylon Government Information Department

Gunatilake, N. (2014). *DRC Database*, Department of Economics, University of Colombo

Lal, V. (2012). Culture. Retrieved from http://www.sscnet.ucla.edu/southasia/Culture/culture.html

Public Record Office. (1870). *Administration Reports - District of Nuwarakalawiya* (CO: 57/51/1870). London: National Archives

Sri Lanka Tourism Development Authority. (n.d.). Retrieved from http://www.sltda.lk

UNDP. (2014). *Human Development Report*. New York: United Nations

UNESCO (n.d.), *Sacred City of Anuradhapura*. Retrieved from http://whc.unesco.org/en/list/200/

Wimalaratana, Wijitapure (2000). *Changes in Consumption Pattern and Economic Underdevelopment in British Ceylon.* Nijmegan Studies in Development and Cultural Change, NICCOS. The Netherlands: Radboud University, .